# ජාතික සංවර්ධනය හා සංවර්ධන සන්නිවේදනය

**එම්.ඩී. සුසිලා ලූර්දු**
***පර්යේෂණ නිලධාරිණී,***
**ප්‍රවෘත්ති හා ප්‍රකාශන ඒකකය**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ**
**හා පුහුණු කිරීමේ ආයතනය**

**සංවර්ධන ක්‍රියාවලියට අයත් සෑම අවධියකදීම අපේක්ෂිත ප්‍රතිලාභීන්ගේ කල්පනාකාරී සහභාගීත්වය සාර්ථක සංවර්ධනයක් සඳහා අවශ්‍යවේය යන පූර්ව අවශ්‍යතාවය මත සංවර්ධන සන්නිවේදනය යන්න රඳා පවතී.** මක්නිසාදයත්, අවසාන වශයෙන් විග්‍රහ කරන විට, අදළ ජනතාව අතර ආකල්ප සහ හැසිරීම් වෙනස්වීමකින් තොරව නාගරික හෝ වේවා ග්‍රාමීය හෝ වේවා සංවර්ධනයේ අපේක්ෂිත මට්ටමක් කරා ළඟා විය නොහැකි නිසාවෙනි. ඒ අනුව, වර්තමානය වන විට සංවර්ධිත රටවල මෙන්ම ශ්‍රී ලංකාව වැනි සංවර්ධනාපේක්ෂාවෙන් සිටින රටවල ද ඉතා අභිරුචියෙන් කථාබහට ලක්ව ඇති සංවර්ධන සන්නිවේදනය පිළිබඳවත්, එයට ප්‍රවේශයක් ලෙස ජාතික සංවර්ධනය පිළිබඳවත්, සංවර්ධන සන්නිවේදනයේ දී ජනමාධ්‍ය භාවිතය හා ගැටළු පිළිබඳවත් සැකෙවින් විමසා බැලීම මෙම ලිපියේ අරමුණයි.

## ජාතික සංවර්ධනය

ජාතික සංවර්ධනය යන සංකල්පය විග්‍රහ කිරීමේ දී එය අංශ කිහිපයකින් සමන්විත වන බව කිව යුතුය. ආර්ථික සංවර්ධනය, සංස්කෘතික සංවර්ධනය, සමාජීය සංවර්ධනය හා සදචාරාත්මක සංවර්ධනය යන අංගයන් ඊට ඇතුළත් වේ.

**"සංවර්ධනය"** යන වචනය පිළිබඳව විවිධ අර්ථ නිරූපණ විවිධ පොත්පත් සහරා පරිශීලනය කිරීමෙන් සොයාගත හැකිය. එසේම ආර්ථික විද්‍යාඥයෝ තම විෂයට අදළවත්, සමාජ විද්‍යාඥයෝ තම විෂයට අදළවත්, දේශපාලන විද්‍යාඥයෝ තම විෂයට අදළවත්, සන්නිවේදන විද්‍යාඥයෝ තම විෂයට අදළවත් විවිධ අයුරින් සංවර්ධනය යන්නට අර්ථ දක්වති.

මෙම විවිධාකාර නිර්වචනයන් හා හැඳින්වීම් අතුරෙන් ප්‍රචලිත අදහස් කිහිපයක් විමසා බැලීම තුළින් සංවර්ධන සන්නිවේදනයට ප්‍රවේශයක් ලෙස, ජාතික සංවර්ධනය යනු කුමක්ද යි හඳුනාගැනීම උචිත වේ.

සංවර්ධනය යන යෙදුම මනඃකල්පිත ජාලයක් බවත්, එහෙයින් නිසි ලෙස අර්ථ ගැන්වීම අපහසු දෙයක් බවත් **"ඩඩ්ලි සියර්ස්"** ශාස්ත්‍රඥයා වරෙක පවසා ඇත. ඒ අනුව සංවර්ධනය යනු "වැඩි දියුණුව" යන්නට පර්යාය පදයක් ලෙස එය පිළිබඳ සලකා බලන බව **සියර්ස්** අවධාරණය කොට තිබේ.

ආර්ථික විද්‍යාඥයින් විසින් සංවර්ධනය යන්න හඳුන්වා දී ඇත්තේ, **"පුද්ගලයින්ගේ ජීවන තත්ත්වය උසස්වන ක්‍රියාවලිය"** වශයෙනි.

රටක ආර්ථික ක්‍රියාවලිය ප්‍රධාන කොට එලෙස අදහස් ඉදිරිපත් වුවත්, "ආර්ථික වර්ධනය යනු සංවර්ධනයම නොවන බවත්, ආර්ථික වර්ධනය හා සංවර්ධනය අතර වෙනසක් පවත්නා බවත්" ඇතැම්හු පෙන්වා දෙති.

ඒ අනුව, ආර්ථික විද්‍යාඥ **"ගුනාර් මිර්ඩාල්"** සංවර්ධනය යනු "සමස්ත සමාජ ක්‍රමයේම ඉදිරි ගමන හෝ විප්ලවීය වෙනස් කමක්" ලෙස නිර්වචනය කලේය.

**ඇඩම්ස්මිත්** නම් ශාස්ත්‍රඥයා පෙන්වා දෙන පරිදි, රටක් සංවර්ධනය වීමට නම් එරට ප්‍රමාණවත් තරම් සම්පත් තිබිය යුතු වේ. එරට සමාජ - ආර්ථ ක්‍රමය තුළ ශ්‍රම සූක්ෂමතාවක් පැවතිය යුතුය.

**කාල්මාක්ස්,** සංවර්ධනය විග්‍රහ කිරීමේ දී වැඩි නැඹුරුවක් දක්වූයේ ප්‍රාග්ධනයටයි. එසේම **රොස්ටෝව්** පවසන්නේ, සංවර්ධනයේ දී වැදගත් වන්නේ තාක්ෂණය බවයි. සංවර්ධනය යන්නට සමාජ විද්‍යාත්මක අර්ථකථනයක් ගෙන ඒමට, **දයා රෝහණ අතුකෝරළ මහතා** වෑයම් කර ඇති බව, පෙනේ. "පරිසරය සමඟ ඒකාබද්ධව යන, පරිසරයට හානිකර නොවන, මිනිසාගේ ශිෂ්ටත්වය ඔප්නංවන සදචාර ගුණධර්ම, සාරධර්ම හා මානව ගුණධර්ම ගරු කරන, මානසිකව

ඉහළ තලයකට පිවිසෙන ජනතාවක් වඩාත් සංවර්ධිත වූ ජනතාවක් ය යන අර්ථකථනයට ලෝකය එමින් සිටී..........." **(දයාරෝහණ අතුකෝරළ - ප්‍රජා සංවර්ධන, 1 වෙළුම, 1 කලාපය, පිට. 65-1992 මැයි)**

**ටැන්සානියාවේ** පළකළ **"අරුෂා"** නම් ප්‍රකාශනයේ සඳහන් වන්නේ "රටක සංවර්ධනය ඇති කරවන්නේ මුදල් විසින් නොව ජනතාව විසින් බවයි. මුදල් හා එය නියෝජනය කරන සමෘද්ධිය සංවර්ධනයේ පදනම විනා එහි වැය නොවන්නේය". යනුවෙනි.

සංවර්ධනය යනුවෙන් හැඳින්වෙන්නේ, "සාමාජික සහභාගීත්වයෙන් යුතුව කෙරෙන වෙනසකි. එමඟින් සාමාජික හා භෞතික අභිවර්ධනයක් ඇති විය යුතුය." යනුවෙන් **එවරට්ස් රොජර්ස්** පෙන්වා දී තිබේ.

සංවර්ධනය පිළිබඳ **විල්බර් ශ්‍රාම්** පවසන්නේ, සංවර්ධනය නමින් යම් දේශයක ඇති කළ යුතු වෙනස කොටස් හතරකින් යුක්ත වන බවයි. එනම්,

i යම්කිසි දැනුමක් තිබීම මුග්ධ බවට වඩා යහපත් ය.

ii නිරෝගීව සිටීම රෝගීව සිටිනවාට වඩා යහපත් ය.

iii යමක් ඇතිව ජීවත්වීම, එසේ නොමැතිව ජීවත්වනවාට වඩා යහපත් ය.

iv සහභාගීත්වය, හුදකලාව සිටිනවාට වඩා යහපත් ය.

යනුවෙන් ඉතාමත් වැදගත් අංශ 4 ක් ඉතා සරලව ඉදිරිපත් කරමින් සංවර්ධනය අර්ථකථනය කර තිබේ.

සංවර්ධනය පිළිබඳ මෙම සියලු නිර්වචනයන් විමසන කළ **"ඩේවිඩ් සී. මැක්ලෙන්ඩ්"** සංවර්ධනය පිළිබඳ ඉදිරිපත් කළ සංකල්පය, සංවර්ධනාත්මක සන්නිවේදනය සම්බන්ධයෙන් වඩාත් අදාළ වන නිර්වචනයක් බව පෙනේ. ඔහුට අනුව, **"සංවර්ධනය සිදුවන්නේ, පුද්ගලයින්ගේ මනසට ඇතුළුවන බීජයක් නිසාය"** යනුවෙනි. මේ තුළින් සංවර්ධන ක්‍රියාවලියත් සන්නිවේදනයත් අතර පවතින අන්‍යෝන්‍ය සබැඳියාව මනාව ප්‍රකට වේ.

එමෙන්ම, **ඊ.එෆ් ෂූමාකර්** විසින් සංවර්ධනය පිළිබඳව දක්වා ඇති අදහස් විමසන කල, ජනතා සහභාගීත්වය හා ඔවුන් ගේ ක්‍රියාකාරීත්වය සංවර්ධනය සඳහා අවශ්‍ය මූලික පදනම වන බව පැහැදිලි වේ.

**"ජනතාව සංවර්ධනයේ නිර්මාතෘන්ය. එසේ නැතිව සංවර්ධනයට ගොදුරු වන ඉලක්ක වන භාණ්ඩ රැසක් නම් නොවේ"** යැයි වැදගත් කියමනක් ද වෙයි. "සංවර්ධනය මැවිය නොහැකිය. පිටතින් ආනයනය කළ නොහැකිය. මිලට ගත නොහැකිය. විශේෂඥයින් හට විස්තීර්ණව සැලසුම් කළ නොහැකිය. එය ප්‍රජාව කෙරෙන් ඇති වී, ප්‍රජාව තුළ ඇති ශක්තිය මප් නංවමින්, ප්‍රජාව විසින්ම ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාවලියක් විය යුතුය."

මෙයින් පැහැදිලි වන්නේ, සම්පත්, ප්‍රාග්ධනය, තාක්ෂණය, ශ්‍රමය යනාදිය රටක සංවර්ධනය සඳහා උපයුක්ත කර ගන්නේ කෙසේද යි, කෙතරම් දක්ෂ අන්දමින්, බුද්ධිමත්ව සැලසුම් කළත් එහි ප්‍රායෝගිකත්වය දැකීමට අත්‍යාවශ්‍යම වන ජනතා සහභාගීත්වය යන්න පිළිබඳව ද ඊට සමානම වූ දැඩි සැලකිල්ලක් දැක්විය යුතු බවයි. ඒ අනුව, ජාතික සංවර්ධනය යනු ජනතාව තුළ පවතින, ජනතා ක්‍රියාකාරීත්වය තුළින් ජනිත වන තත්ත්වයක් වන බව නිගමනය කළ හැකි වේ.

මෙම සහභාගීත්වය, ක්‍රියාකාරීත්වය, කාර්යක්ෂමතාවය යනාදිය රටක ජනතාව තුළ ඇති කිරීමට නම් ඒ පිළිබඳව කිසියම් උත්තේජනයක් එම ජනතාව තුළ ඇති කළ යුතු වේ. මෙම තත්ත්වය ජනතාවගේ මනස හා බැඳි සංසිද්ධියකි. එනම් මෙය, පූර්ණ වශයෙන්ම සන්නිවේදන කර්තව්‍යයකි. පූර්වයේ **මහාචාර්ය මැක්ලෙන්ඩ්** ගේ සංවර්ධනය පිළිබඳ අර්ථකථනය සංවර්ධනාත්මක සන්නිවේදනය හා වඩාත් පර්යාය වන බව පැවසුවේ ද මෙම තත්ත්වය නිසා ය.

මෙහි දී, සංවර්ධන සන්නිවේදනය පිළිබඳ වඩාත් පැහැදිලි අවබෝධයක් ලැබීමට නම් ආර්ථික සංවර්ධනය නම් සංකල්පය කෙරෙහි විශේෂාකාරයකින් අවධානිත විය යුතු වේ. ආර්ථික සංවර්ධනය යන්නට පැහැදිලි නිර්වචනයක් සැපයීමට ආර්ථික විද්‍යාඥයින් අතර ද විවිධ මතභේදයන් පවතී. කෙසේ වුව ද, ආර්ථික සංවර්ධනය යනු, කිසියම් රටක පවත්නා ස්වාභාවික සම්පත් මෙන්ම මානව සම්පත් ද රටේ වැසියන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම පිණිස බුද්ධිමත්ව උපයෝගී කර ගැනීම යනුවෙන් හඳුන්වාදිය හැකිය. ආර්ථික සංවර්ධනය මැනීමේ

දර්ශකයක් ලෙස දළ ජාතික නිෂ්පාදිත හා ඒක පුද්ගල ආදායම පමණක් ප්‍රමාණවත් නොවන බැව් පැවසූ එක්සත් ජාතීන්ගේ සංවිධානය මෙම දර්ශකය ප්‍රජාවගේ ජීවන තත්ත්වය ද පෙන්නුම් කරන දර්ශකයක් සේ තව දුරටත් පුළුල් කරන ලදී. ජනමාධ්‍ය මඟින් ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමේ දී මෙම තත්ත්වය (ජීවන තත්ත්වය ද පෙන්නුම් කරන දර්ශකය) වඩාත් උචිත විය. නවසිය පනස් ගණන් වල හා හැට ගණන් වල දී ආර්ථික විද්‍යාඥයින් හා ජනසන්නිවේදන විද්‍යාඥයින් අතර පැතිර ගිය ප්‍රාග්ධන සූක්ෂම සංකල්පය හා ශ්‍රම සූක්ෂම සංකල්පය අතරින්, සංවර්ධන සන්නිවේදනය නවතම ආකාරයකට හැඩගැසීම සඳහා ශ්‍රම සූක්ෂම සංකල්පය වඩාත් දායකත්වයක් සපයනු ලැබූ බව කිව යුතුය. මෙම ශ්‍රම සූක්ෂම සංකල්පයේ වර්ධනයත් සමඟම සංවර්ධන සන්නිවේදනය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වීමට පටන් ගැනීම, ඊට හේතුවයි. ගැමි ජනතාව තුළ සංවර්ධනය පිළිබඳ නව අදහස් හා ආකල්ප ව්‍යාප්ත කිරීමටත්, ආයතනික රටා සකස් කිරීමටත්, ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීමටත්, සන්නිවේදනය වඩ වඩාත් අවශ්‍ය බැව් ප්‍රත්‍යක්ෂ වන්නට විය. සංවර්ධන සන්නිවේදනයේ නැඟීම වඩාත් වර්ධනය වීමේ උද්‍යෝගය හා ප්‍රබෝධය ලෙස මෙය හැඳින්විය හැකිය. මෙහි දී, සංවර්ධන සන්නිවේදනය සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති නිර්වචනයන් කිහිපයක් විමසීම උචිත වේ.

## සංවර්ධන සන්නිවේදනය යනු කුමක්ද?

**"කිසියම් ජනතාවක් දරිද්‍රතාවයෙහි සිට වඩාත් සමෘද්ධි සම්පන්න තත්ත්වයක් කරා පත් කිරීමටත්, ආර්ථික වෘද්ධියක් ඇති කිරීමටත්, සමාජ සමානාත්මතාවක් පතල කිරීමටත්, මිනිසාගේ නෛසර්ගික ශක්‍යතා වලින් නිසි ප්‍රයෝජන ලබා ගැනීමටත්, අනුබල දෙන සන්නිවේදනය සංවර්ධනාත්මක සන්නිවේදනය ලෙස හැඳින්විය හැකිය." යනුවෙන් මහාචාර්ය විමල් දිසානායක තම "සංවර්ධනය හා සන්නිවේදනය" නම් ග්‍රන්ථයේ සඳහන් කර සිටී.** තුන්වැනි ලෝකයේ රටක් වශයෙන් ශ්‍රී ලාංකික ජන සමාජයේ සංවර්ධන සන්නිවේදනය උදෙසා වඩාත් උචිතවන මෙම නිර්වචනය, බටහිර සන්නිවේදකයින් ද විවිධ ආකාරයට අර්ථ දක්වා ඇති බව කිව යුතුය.

50 දශකයේ අග භාගයේ දී පමණ බිහි වූ සංකල්පයක් වන මෙම සංවර්ධන සන්නිවේදනය බටහිර සන්නිවේදකයින්ගේ ඇසින් විග්‍රහ කරන විට, ඔවුන්ගේ අදහස් වන්නේ, මෙය බහුතර ජන පිරිසකගේ සමාජ - ආර්ථික සුබ සිද්ධිය උදෙසාම කැප වූවක් විය යුතු බවයි. මෙහි දී, **විල්බර් ශ්‍රාම්** වැදගත් වේ. ඔහු විසින් 1964 දී ලියූ "**ජන සන්නිවේදනය හා ජාතික සංවර්ධනය**" යන කෘතිය, දියුණුව හා දියුණුව කරා යන රටවල ජන සන්නිවේදන විද්‍යාඥයින් අතර මහත් බලාපොරොත්තු ඇති කළ කෘතියක් බවට පත් වූයේ එහෙයිනි.

**ඩැනියෙල් ලර්නර්** ද සංවර්ධනය හා සන්නිවේදනය පිළිබඳව උනන්දුවෙන් අධ්‍යයනය කළ අයෙකි. ඔහු සිය සන්නිවේදන ආකෘතියෙන් මේ බව අනාවරණය කරන ලදී. සංවර්ධනය වන රටවල දැඩි උනන්දුවක් මෙම නව සංකල්පය කෙරෙහි පැවති අතර එහි දී විශේෂ උනන්දුවකින් කටයුතු කළ රටක් ලෙස **පිලිපීනය** හඳුන්වා දිය හැකි වේ. පිලිපීනයේ රාජ්‍ය විශ්ව විද්‍යාලයේ **ලොස් බානෝස්** හි සංවර්ධන සන්නිවේදනය පිළිබඳ අංශයක් ආරම්භ කිරීමෙන්ම ඒ බව පෙනී යයි. 60 දශකයේ අග භාගයේ දී ආරම්භ කළ එම සංවර්ධන සන්නිවේදන අංශය තුළ මූලිකත්වය ගෙන කටයුතු කළ **නෝරා ක්වෙබ්රාල්** සංවර්ධනයට අර්ථකථනයක් දුන්නේ මෙසේය.

"සංවර්ධන සන්නිවේදනය යනු යම් රටක් දුගී දුප්පත්කමින් බැහැර කොට එහි ආර්ථික හා සමාජ ශුභ සිද්ධිය ඇති කරවන ක්‍රියාවලියයි." සංවර්ධන සන්නිවේදනය යනු මානව සන්නිවේදනය තුළින් පුළුල් ආර්ථික හා සමාජ සමානාත්මතාව ඇති කරලිය හැකිවාක් මෙන්ම එමඟින් මානව අවශ්‍යතා සියල්ල සපුරාලීමට ද හැකියාව ඇතැයි යනුවෙනි.

**ක්වෙබ්රාල්** ගේ මෙම නිර්වචනයට අනුව, සංවර්ධන සන්නිවේදනයක් වැඩි වශයෙන් පැවතිය යුත්තේ, සංවර්ධනය කරා ගමන් කරන රටවල් සඳහා බව පැහැදිලි වේ. රටක් සංවර්ධනය වීමට නම්, එරට ජනතාවට දේශපාලනමය විසඳුම් තුළින් නැති කළ යුතු ප්‍රශ්න නොතිබිය යුතුය. එනම්, යම්කිසි රටක දේශීය කර්මාන්ත නඟා සිටුවීම, ගෘහ කර්මාන්ත හෝ සුළු කර්මාන්ත දියුණු කිරීම, රටට ගලා එන විදේශ භාණ්ඩ නිසා පහර වදින දේශීය සුළු කර්මාන්තකරුවන් ආරක්ෂා කිරීම, ප්‍රවාහන සේවාවන් පවත්වාගෙන යාම, සෞඛ්‍ය නඟා සිටුවීම, ගොවිතැන් සඳහා ණය පහසුකම් සැපයීම, නොයෙකුත් සේවා සැපයීම ආදී අංශයන් හි ගැටළු අවම විය යුතුය. එමෙන්ම රටක ව්‍යුහමය සංශෝධන ඇති කිරීම කළ යුත්තේ, දේශපාලන රාමුවක් තුලය යනාදී වශයෙන් නෝරා **ක්වෙබ්රාල්**ගේ නිර්වචනයෙන් අදහස් වේ.

මෙම සියල්ල කෙරෙහි ප්‍රජාව සතු ආකල්ප වඩා වැදගත් වේ. එබැවින්, පෙර සඳහන් කලාක් මෙන්ම රටක සංවර්ධනය සාක්ෂාත් කිරීමට නම්, එරටෙහි ජනතා සහභාගීත්වය හා ජනතාව තුළ යම් කිසි ආකල්පමය වෙනසක් ඇති කිරීම සිදු කළ යුතු වේ. ඒ සඳහා සංවර්ධන සන්නිවේදනයක් ඇතිවීම අත්‍යාවශ්‍යම කරුණක් බව පැහැදිලිය.

අර්ථ ශාස්ත්‍රඥ **මහාචාර්ය මිලිකන්ට** අනුව ද රටක සංවර්ධනය නම් තත්ත්වය කරා එළැඹීමට අවශ්‍ය සකලවිධ ක්‍රියාදාමයන් අපේක්ෂිත ඉලක්කයන් කරා ගෙන යන්නට මූලික වන්නේ සන්නිවේදනය නම් මෙවලමයි.

මෙම වෙනස හෙවත් විප්ලවය ප්‍රධාන වශයෙන් මනෝමූලික තත්ත්වයකි. මානසික විපර්යාසයකි. සිතුම් පැතුම්, හැසිරීම හා ආකල්ප සංවර්ධනයට සුදුසු තත්ත්වයක නොවුනු කල්හි එය සංවර්ධනයට බාධාවක් වේ. සංවර්ධන විශේෂඥයින් එය පුද්ගල බාධක ලෙස හඳුන්වයි. එනම්, පාරම්පරික බව, කර්මවාදය, පටුජීවන දැක්ම, ඉදිරි දැක්මකින් තොරවීම, පසුගාමී බව හා මිත්‍යා විශ්වාස යනාදිය මේ පුද්ගල බාධක යටතට ගැනේ.

මෙම පුද්ගල බාධක ඉවත් කිරීමේ කාර්යයට, සංවර්ධන ක්‍රියාදාමයේ ප්‍රධාන අංගයක් වශයෙන් ඊට අදාළ සන්නිවේදනය (සංවර්ධන සන්නිවේදනය) දැඩිව අවශ්‍ය බව සංවර්ධන විශේෂඥයින්ගේ අදහසයි.

සංවර්ධන සන්නිවේදනය යනු "ප්‍රජා සහභාගීත්වය හා ප්‍රජා අවශ්‍යතා මත සංවර්ධන යෝජනා ක්‍රම සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය ආයතන හා ප්‍රජාව තුළ මෙන්ම රාජ්‍ය ආයතන හා ප්‍රජාව අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව පවත්වාගන යෑම හා අදහස් හුවමාරු කර ගැනීම සඳහා යොදන ක්‍රියාදාමය" යනුවෙන් තවත් අයෙක් හඳුන්වයි. **(සංස්කෘති, 17 කලාපය, 1-2 සහරාව, 1983 ජනවාරි-මාර්තු සංවර්ධනය හා ප්‍රජා සහභාගීත්වය, ලක්ෂ්මන් වික්‍රමසිංහ)**

**මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර** සංවර්ධන සන්නිවේදනය ලෙස දකින්නේ ගුවන්විදුලිය, පුවත්පත, රූපවාහිනිය, සිනමාව ඇතුළුව යම් යම් ජනමාධ්‍ය මෙහෙයවමින් යම්කිසි මානව ජනාවාසයක කිසියම් යහපත් පරිසරයක් සකසාලීමයි.

සංවර්ධන සන්නිවේදනය පිළිබඳ මෙම කරුණු සියල්ලම සැලකිල්ලට ගැනීමේ දී, එය සම්පූර්ණයෙන්ම පාහේ **"පෙළඹවීම"** ඉලක්ක කරගත්තක් බව පැහැදිලි වේ. සන්නිවේදන විෂයේ දී **"අභිප්‍රේරණය"** යනුවෙන් හඳුන්වන්නේ මෙයයි. ඉලක්කගත යම් අරමුණක් සඳහා පෙළඹවීම, අභිප්‍රේරණය නම් වේ.

මෙම තත්ත්වය සංවර්ධිත රටවල් තම වාණිජ අරමුණු සඳහා අති සාර්ථක අන්දමින් උපයෝගී කරගනු ලබයි. සංවර්ධනය වෙමින් පවතින රටවල සංවර්ධන සන්නිවේදනය මෙන්ම එය විෂයක් ලෙස වර්ධනය වීම ද, ආරම්භ වූයේ මෙම සංවර්ධන අරමුණු හේතු කොටගෙන විය හැකිය.

## සංවර්ධන සන්නිවේදන ක්ෂේත්‍රයේ වර්ධනය

සන්නිවේදන විශේෂඥයන් තුන්වන ලෝකයේ සංවර්ධනය ගැන උනන්දු වන්නට පටන් ගත්තේ 1950 දශකයේ පමණ පටන් ය. 1968 දී **ඩැනියෙල් ලර්නර්** විසින් සම්පාදනය කරන ලද **සාම්ප්‍රදායික සමාජයේ අවසානය /අභාවය** (The Passing of Traditional Society) මෙන්ම **විල්බර් ශ්‍රාම්** විසින් 1964 දී සම්පාදිත **ජන මාධ්‍ය හා ජාතික සංවර්ධනය"** (Mass Media and National Development) යන කෘතීන් බහුතර පාඨක පිරිසක් අතට ළඟා වීම ද, මෙම විෂය ක්ෂේත්‍රය වර්ධනයට එක් රුකුලක් විය. **මහාචාර්ය ලර්නර්** සිය කෘතියෙන් පවසා සිටියේ නාගරීකරණය වැඩිවත්ම ජාතික සාක්ෂරතා මට්ටම ඉහළ යන බවත්, සාක්ෂරතාවයේ ඉහළ යෑමත් සමඟ ජනමාධ්‍ය භාවිතය ද ඉහළ යන බවයි.

**මහාචාර්ය විල්බර් ශ්‍රාම්** තම ජනමාධ්‍ය සහ ජාතික සංවර්ධනය කෘතිය තුළින් සංවර්ධන සන්නිවේදනය පිළිබඳව බුද්ධිමය නවෝදයකට මූල පුරන ලදී. තුන්වන ලෝකයේ රටකට ජනමාධ්‍ය ව්‍යාප්ත කිරීමෙන් ජනතාවට අවශ්‍ය තොරතුරු ලබාදීමේ හැකියාව වර්ධනය වන බවත්, එතුළින් ජනතාව සංවර්ධනය කරා ගෙන යා හැකි බවත් හෙතෙම තර්ක කළේය. තුන්වන ලෝකයේ රටවල සංවර්ධන සන්නිවේදනය දියුණු කිරීමට එම රටවල නායකයින්ට මෙම **ශ්‍රාම්**ගේ කෘතිය මහත් බලපෑමක් විය. මෙම හේතුව නිසා සංවර්ධන සන්නිවේදන විෂය ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා විශාල ආයෝජනයක් දැරීමට එම රටවල නායකයින්ට සිදුවිය.

මේ අයුරින් සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘති ආරම්භ කිරීමට පදනම් ගොඩනැඟීම ආරම්භ විය. එක්සත් ජනපද විශ්ව විද්‍යාල හා රාජ්‍ය ආයතන මඟින් අනුග්‍රහය දක් වූ සන්නිවේදන ව්‍යාපෘතිවල කටයුතු කර ඇති **මහාචාර්ය ජෝන් කේ. මායෝ** මෙලෙස ආරම්භ වී ක්‍රියාත්මක වූ සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘති පිළිබඳ පවසා ඇති දේ තුලින් සංවර්ධන සන්නිවේදන ක්ෂේත්‍රය පිළිබඳ යම් අදහසක් ගත හැකි වේ.

"ව්‍යාපෘති වලින් බොහොමයක් ආරම්භ වී මාස හෝ වසර කිහිපයකින් නිමාවට පත් විය. බොහෝ විට නිර්ණාමිකව පවා සිදුවිය. අනෙක්වා වැඩි කාලයක් පාවෙමින් තබා ගැනීමේ හැකියාව තිබුණි. ඒවායේ දිශාව වැරදී ආරම්භ කළ කාර්යය නිම කිරීමට නොහැකිව, අරමුණකින් තොරව ඔබ - මොබ සැරිසරන සෙයක් දක්නට ලැබුණි. වාසනාවන්ත කිහිප දෙනෙක් ඔවුන්ගේ අරමුණ සපුරා ගැනීමට සමත් වූහ." යනුවෙන් සංවර්ධන සන්නිවේදනය සම්බන්ධයෙන් ආරම්භ කළ ව්‍යාපෘතීන් හි තත්ත්වය විස්තර කර තිබේ.

මෙසේ යම් යම් අවස්ථාවල අක්‍රීය වෙමින් හා සක්‍රීය වෙමින් සංවර්ධන සන්නිවේදන ක්ෂේත්‍රය අද වන විට බටහිර රටවල මෙන්ම විශේෂයෙන් තුන්වන ලෝකයේ රටවල වඩාත් ජනප්‍රිය විෂයක් බවට පත්ව තිබේ.

සංවර්ධනාත්මක සන්නිවේදනය යනු හුදෙක් ජාතික දියුණුව සඳහා ජනමාධ්‍ය උපයෝගී කර ගැනීමම නොවේ. ජන සන්නිවේදනය මෙන්ම පුද්ගලාන්තර සන්නිවේදනය ද ඉතාමත් වැදගත් වේ. සංවර්ධන සන්නිවේදනය සාර්ථක වීමට පුද්ගලාන්තර සන්නිවේදනය හා ජනසන්නිවේදනය අතර මනා සබඳතාවක් ගොඩ නැඟිය යුතු වේ. සංවර්ධන සන්නිවේදනය සම්බන්ධයෙන් කර ඇති පර්යේෂණ වලින් හෙළි වී ඇති තොරතුරු වලට අනුව, නව ප්‍රවෘත්ති, නව ආකල්ප හා දැනුම ජනතාවට ඉදිරිපත් කිරීමට **"ජන සන්නිවේදනය"** වඩා යෝග්‍ය වන අතර යම් යම් අරමුණු සඳහා ජනතාව පොළඹවා ගැනීමේ දී ජන සන්නිවේදනයට වඩා පුද්ගලාන්තර සන්නිවේදනය වඩා උචිත බව පෙන්වා දී තිබේ.

සංවර්ධනාත්මක සන්නිවේදනය සම්බන්ධ වැදගත් කරුණක් ලෙස පෙන්වා දිය හැක්කේ, සංවර්ධන සන්නිවේදනයේ දී සිදුවන්නේ, ප්‍රචාරණයේ දී හෝ වෙළඳ දැන්වීම් තුළින් සිදුවන රළු සන්නිවේදනය වෙනුවට ඉතා සුමට මහක් අනුගමනය කිරීමයි. එනම්, එකම මඟක් දැඩි ලෙස ඉදිරිපත් කිරීම වෙනුවට විවිධ ක්‍රියාමාර්ග දක්වා ඉන් එකක් වඩාත් යෝග්‍ය කවර හෙයින් දැයි හේතු දක්වා පැහැදිලි කිරීමයි. නොඑසේනම් ග්‍රාහකයා තමා වෙතට නතුකර ගැනීම වෙනුවට ඔහු විසින් අපේක්ෂිත ක්‍රියාමාර්ගය ඔහුම තෝරා ගන්නා බව ග්‍රාහකයාට ප්‍රත්‍යක්ෂ කරවීමයි.

වර්තමානය වනවිට, සංවර්ධන සන්නිවේදන ක්ෂේත්‍රයේ වර්ධනය අර්ථාන්විත මානව ගවේෂණයක් ලෙස ඉතා යුහුව වැඩී ඉතා ඉහළ තත්ත්වයකට පැමිණ තමාරය.

මෙම සංවර්ධන සන්නිවේදන විෂය ප්‍රධාන වශයෙන්ම සමාජීය විද්‍යා ක්ෂේත්‍රයෙහිලා සැලකිය හැකි ශාස්ත්‍ර ගවේෂණ මාර්ගයකි. එය එම ක්ෂේත්‍රය ඔස්සේ වැඩෙන ආකාර පරීක්ෂා කරන විට මූලික වශයෙන් කරුණු තුනක් පිළිබඳ සැලකිලිමත් වේ.

i සංවර්ධන සන්නිවේදනය අවශ්‍යයෙන්ම අභිප්‍රේරණාත්මක වන බව.

ii සංවර්ධන සන්නිවේදකයා තම සන්නිවේදන අරමුණ කෙරෙහි ඇති ස්ථිරසාර විශ්වාසය.

iii සංවර්ධනාත්මක සන්නිවේදනය මනිනු ලබන්නේ, එමඟින් අත්පත් වූ ප්‍රායෝගික ප්‍රතිඵල 03 අනුව ය. යන්න එකී සැලකිලිමත් වන කරුණු වේ.

සංවර්ධනයේ දී වඩාත් වැදගත් වන්නේ, ලොව පිළිගත් සංවර්ධන යොමුවක් ඔස්සේ, දේශීය අවශ්‍යතාවයන් අනුව සකසා කිසියම් රටක රජය විසින් ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගෙන එම සංකල්පය ඔස්සේ ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන කටයුතු පිළිබඳ මනා අවබෝධයකින් යුතුව කළ යුතු වෙනස කුමක්ද? එය කරන්නේ කෙසේද? ලැබිය යුත්තේ කෙබඳු සහභාගීත්වයක්ද? එය ඉටු කරගන්නේ කෙසේද? යන මූලික ප්‍රශ්න වලට පිළිතුරු සොයා ඒ සඳහා සන්නිවේදන ක්‍රමෝපායයන් හා ශිල්ප න්‍යායන් භාවිතයට ගැනීමයි.

**සංවර්ධන සන්නිවේදනයේ දී වඩාත් වැදගත් වන්නේ, අනුනයාත්මක සන්නිවේදනය සහ උපදේශාත්මක සන්නිවේදනය යි.** යම් කාර්යයක් සඳහා පෙළඹවීම (ප්‍රේරණය) ඉලක්ක කොටගෙන ක්‍රියාත්මක කරනු ලබන සන්නිවේදන

ක්‍රියාදාමය අනුනයාත්මක සන්නිවේදනය වේ. දැනුම, අවබෝධය ලබාදීම ඉලක්ක කරගත් අධ්‍යාපනික අරමුණු මත පදනම් වූ සන්නිවේදන ක්‍රියාදාමය උපදේශාත්මක සන්නිවේදනය යි.

සංවර්ධන සන්නිවේදන ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා **අනුනයාත්මක සන්නිවේදනය හා උපදේශාත්මක සන්නිවේදනය** උපයෝගී කර ගනිමින් පණිවුඩ සන්නිවේදනය කිරීමේ දී **මහාචාර්ය විල්බර් ශ්‍රාම්** පෙන්වා දුන් පරිදි ග්‍රාහකයාත්, සන්නිවේදකයාත් අතර එක සමාන මනෝ වෘත්තීන් ඇතිවන පරිදි එය කළ යුතු වේ. එම සාර්ථක මානසික ගනුදෙනුව අවසානයේ දී, සංවර්ධන සන්නිවේදනය තුළින් බලාපොරොත්තු වන අපේක්ෂාවන් සාධනය කර ගැනීම පහසු වේ.

මෙම සංවර්ධන සන්නිවේදන කාර්යයේ දී භාවිතා කළ හැකි සන්නිවේදන මාධ්‍යයෝ බොහෝ ය. ඒ අතරින් ජනමාධ්‍ය භාවිතය පිළිබඳව සැලකිලිමත් වීමේ දී එය සංවර්ධන කාර්යය සඳහා සුවිශේෂ වන බැව් පෙනේ. එමෙන්ම, මෙම කාර්ය සඳහා ජනමාධ්‍යයන් භාවිත කරන විට යම් යම් ගැටළු සහගත තත්ත්වයන්ට ද මුහුණ දීමට සිදුවන බව සඳහන් කළ යුතු ය.

## සංවර්ධන සන්නිවේදනඃ ජනමාධ්‍ය භාවිතය හා ගැටළු

යම්කිසි රටක් සංවර්ධනය කරා ළඟා වීමේ දී අත්‍යාවශ්‍යයෙන්ම එම රටෙහි සන්නිවේදන මාධ්‍යන්ගේ භාවිතය ද උපරිම අයුරින් තිබිය යුතු වේ. පූර්ව පරිච්ඡේදයන් හි ඇතැම් ස්ථානයන් හි අවධාරණය කර ඇති ආකාරයටම රටක් සංවර්ධනය කරා යන ගමනේ දී සන්නිවේදනය උපරිම මට්ටමින් සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමට භාවිත කිරීම සංවර්ධන සන්නිවේදනයේ අපේක්ෂාව වේ. මෙම තත්ත්වය විශේෂයෙන්ම තුන්වන ලෝකයේ රට වලට වඩාත් අදාළ වේ.

තුන්වන ලෝකයේ රටවල සංවර්ධනය කරා යන ගමනේ දී භාවිතා කරන සන්නිවේදන මාධ්‍ය අතර ජනමාධ්‍ය උපයෝගිත්වයේ විවිධ ගැටළු ඇති බව පෙනෙන්නට ඇති කරුණකි.

රටවල් 11 ක පර්යේෂණ අත්දැකීම් ආශ්‍රයෙන් ලියන ලද **තුන්වන ලෝකයේ විද්‍යුත් සන්නිවේදනය** නම් කෘතිය (පරිවර්තනය, **චන්ද්‍රසෝම විතානගේ** - 1991) තුල ද, **ඉන්දියාව, පිලිපීනය,** හා **මෙක්සිකෝව** ආශ්‍රිත පර්යේෂණ අත්දැකීම් තුළින් ලියවුණු **නෙවිල් ජයවීරගේ "ගැමි මාධ්‍ය සහ සංවර්ධන සන්නිවේදනය මිත්‍යාව හා යථාර්ථය"**, යන කෘතිය තුල ද, අදාළ රටවල් තුළ ජනමාධ්‍යයන් නිසි පරිදි යොදවා ගැනීමේ ඇති අපොහොසත් බව හුවා දක්වා තිබේ.

තුන්වන ලෝකයේ රටවල සංවර්ධනය සඳහා ජනමාධ්‍ය යොදා ගන්නා අයුරු ඉතාමත් හොඳින් ග්‍රහණය කරගත් පිරිසක් සිටිය ද, එය ක්‍රියාත්මක තත්ත්වයට පත් කරගන්නා විට ඊට බාධාකාරී ගැටළු ගණනාවකට මුහුණදීමට සිදුවන බැව් පෙනේ. මෙම රටවල සංවර්ධනය සඳහා ජනමාධ්‍යයන් උපයෝගී කර ගැනීමට බාධාකාරී වූ ගැටළු අතර ප්‍රමුඛතාවය ගන්නා ගැටළු රාශියකි. ඒවා සමාජ-ආර්ථික හා දේශපාලන වශයෙන් වූ සෑම අංශයකින්ම ඇති වන ගැටළු බව පෙන්වා දිය හැකිය. මෙම රටවල බොහෝ දුරට සෑම අංශයක්ම පාහේ දේශපාලන අධිකාරී බලයට නතුවීමේ හේතුවෙන් ජනමාධ්‍ය තුළින් අපේක්ෂිත අරමුණු කරා යෑමේ අපහසුවක් දකීම සුලභ තත්ත්වයකි. එමෙන්ම, බොහොමයක් ජනමාධ්‍ය පවත්වාගෙන යනු ලබන්නේ, වාණිජමය අනුග්‍රහයන් මත වන බැවින්, අපේක්ෂිත අරමුණු වලට වඩා වාණිජ නැඹුරුතාවය හා ඊට නතුවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබීම ද, තුන්වන ලෝකයේ රටවල ජනමාධ්‍ය සම්බන්ධයෙන් දැකිය හැකි ගැටළුවක් වේ. ජනමාධ්‍ය බොහොමයක් රාජ්‍ය ආයතන බැවින් සෙසු රාජ්‍ය ආයතනවල මෙන්ම මන්දගාමී තත්ත්වක් විද්‍යාමාන වීම ද හඳුනාගත හැකි තත්ත්වයකි. මෙම රටවල පොදු ගැටළුවක් වූ එක එක ක්ෂේත්‍ර හා සම්බන්ධ පුහුණු විශේෂඥ දැනුම සහිත පුද්ගලයින්ගේ හිඟකම සංවර්ධන සන්නිවේදන ක්ෂේත්‍රයට ද පොදු තත්ත්වයක් වේ. එනම්, සංවර්ධන සන්නිවේදනයට අදාළ පුහුණු විශේෂඥ සන්නිවේදකයින් හිඟකම හා සිටින සීමිත පිරිස සඳහා ද ක්‍රමවත්ව, මාධ්‍ය සඳහා දායකවීමේ ඉඩකඩ ඇහිරී යාමයි. තව ද, මෙම රටවල දැකිය හැකි විශේෂිත ගැටළුවක් වන්නේ, සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කරන ආයතන හා ජනමාධ්‍ය අතර පැහැදිලි සම්බන්ධීකරණයක් නොමැතිවීම තුළින් කොතරම් සැලසුම් නිර්මාණය කල ද ඒවා ජනතාව අතරට නොයාම නිසා ඇතිවන ගැටළුවයි. සංවර්ධනය සඳහා ජනමාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් ඇති තවත් වැදගත් ගැටළුවක් වන්නේ, බොහෝ විට රටේ සංවර්ධන පරමාර්ථ වලට වඩා හුදු ප්‍රචාරාත්මක සන්නිවේදන රටාවකට හුරු වීමයි. එනම්, නොයෙකුත් බල කණ්ඩායම් වල පටු අරමුණු ඉටු කිරීමට ජනමාධ්‍ය

යොද ගැනීමයි. එමෙන්ම, මේ සියල්ල අභිබවා මෙම රටවල ඉදිරියට පැමිණෙන තවත් ගැටළුවක් වන්නේ, ජනමාධ්‍යයත් ප්‍රමාණවත් පරිදි පුළුල් කිරීම හා ව්‍යාප්ත කිරීමට අවශ්‍ය කරන ප්‍රාග්ධන ඌනතාවයි. සංවර්ධනය හා ජනමාධ්‍ය පිළිබඳව ස්ථිරසාර නිශ්චිත ප්‍රතිපත්ති නොමැති වීමත්, පවතින ප්‍රතිපත්තිවල දුර්වලතාවත් මෙම ගැටළු තව දුරටත් උග්‍ර කිරීමට හේතුවන බව ද පෙන්වා දිය හැකිය.

සංවර්ධනය සඳහා ජනමාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් මෙවන් වූ ගැටළු රාශියකට මුහුණ දෙන තුන්වන ලෝකයේ රටවල්, පළමුවෙන් කළ යුත්තේ, මෙම බාධාකාරී තත්ත්වයන් මඟ හරවා ගත යුත්තේ කුමන අයුරකින් ද යන්න සොයා බැලීමයි. එසේ නොමැතිව ජාතික සංවර්ධනය සඳහා ජනමාධ්‍ය උපයෝගී කර ගැනුම දුෂ්කර වන්නකි. එමෙන්ම, තව දුරටත්, ජනමාධ්‍ය ජනතාව හා රාජ්‍ය තන්ත්‍රය යන අංශ අතර ඇති පරතරය, අන්‍යෝන්‍ය අසම්බන්ධීකරණය පෘථුල වීමේ ඉඩක් පවතී.

**"ලූෂන්පයි"** නම් සන්නිවේදන විශේෂඥයා මෙම ගැටළු සහගත තත්ත්වය එම රටවල දේශපාලන ක්‍රියාවලිය හා බද්ධ වූවක් බව සඳහන් කර තිබේ. ඔහු ඉදිරිපත් කළ අදහසට අනුව, **"පුද්ගල මත සංකල්ප සාමාජික පදනමක පිහිටා ඉදිරිපත් කිරීමටත්, විග්‍රහ කිරීමටත් ජනමාධ්‍ය මගින් වැදගත් මෙහෙයක් සිදු කළ හැකිය. මෙය රටක දේශපාලන ක්‍රියාවලිය හා බද්ධ වූවක් බැවින් විශේෂ අවධානයක් දේශපාලන ක්ෂේත්‍රය වෙත යොමු කරන ලදී."**

මේ සම්බන්ධව තවත් අදහස් ඉදිරිපත් කරන **"ඉතියෙල් ද සෝලා පූල්"** නම් සන්නිවේදන විශේෂඥයා පවසන්නේ, සංවර්ධනය සඳහා ජනමාධ්‍ය විධිමත්ව භාවිතා කිරීමට බාධාවක් වී ඇත්තේ මෙම කරුණු අරබයා රටවල පාලක පක්ෂය පැහැදිලි පිළිවෙත් හා තීරණ ගැනීමට අපොහොසත් වීම නිසා බවයි. ඔහු තවදුරටත් අදහස් දක්වමින් මෙසේ ද පවසයි. "සංවර්ධනය වන රටවල් තම සීමිත සම්පත් වලින් ජන සන්නිවේදනය සඳහා කොතෙක් අයෝජනය කළ යුතු ද? ජන සන්නිවේදනය සම්බන්ධයෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශයට හිමි යුතුකම් - වගකීම් හා අයිතිවාසිකම් මොනවා ද? ජනමාධ්‍ය කොතෙක් රජයේ පාලනයට නතුවිය යුතු ද? කෙතරම් නිදහස දිය යුතු ද? ජනමාධ්‍යයන්ගෙන් විසරණය වන පණිවිඩ කෙබඳු බුද්ධි මට්ටමකට, රසඥතාවයකට හා සංස්කෘතික පසුතලයකට අනුව සැකසිය යුතුද? යන ප්‍රශ්න වලට පිළිතුරු නොසොයා නිසි ලෙස සංවර්ධන කාර්යයට සන්නිවේදන මාධ්‍ය ඉවහල් කරගත නොහැකි බවයි."

ජන සන්නිවේදනයේ ප්‍රධාන අරමුණු හා කාර්යයන් පිළිබඳව විවිධ විද්‍යාඥයන් විවිධ අදහස් හා මතවාද ඉදිරිපත් කර සිටී. එම අරමුණු සියල්ල කැටිකර ගත් විට මෙවැනි අරමුණු කිහිපයක් පෙන්වා දිය හැකිය. එනම් තොරතුරු සම්පාදනය, ජනමත නිර්මාණය කිරීම, සමාජානුයෝජන ක්‍රියාවලිය පවත්වා ගැනීම, සමාජය ආරක්ෂා කිරීම, පුද්ගලයාව යම් යම් දේවල් සම්බන්ධයෙන් පොළඹවා ගැනීම හා ඔවුන්ගේ විනෝදාස්වාදය සම්බන්ධව කටයුතු කිරීම යන අරමුණු වේ. සන්නිවේදන අරමුණු හා සංවර්ධන සන්නිවේදනයේ අරමුණු කොතෙක් දුරට ඒකාබද්ධ කරගත හැකිදැයි විමසා බැලීම මෙහි දී ඉතා වැදගත් වේ.

තොරතුරු සම්පාදනය නම් අරමුණෙහි දී, එය කුමක් සඳහා ද? යන පැනයට සරල පිළිතුර වන්නේ සංවර්ධනය සඳහා අවශ්‍ය දැනුම, අවබෝධය, ආකල්ප හා හැඟීම් ඇති කරලීම පිණිසය යන්නයි.

ජනමත නිර්මාණය කුමක් අරබයා ද? යනුවෙන් විමසා බැලුවහොත්, සංවර්ධනයට අදාළ ගැටළු, සාකච්ඡා, අදහස් - උදහස් පිළිබඳ නිසි ප්‍රතිචාර ලබා ගැනීමටත්, සහභාගීත්වය නම් වූ කරුණ කෙරෙහි ක්‍රියාකාරී තත්ත්වය ඇති කරලීමටත් වශයෙන් සංවර්ධනාත්මක අරමුණු කෙරෙහි ගොනු කළ හැකිය. සංවර්ධනය පිළිබඳ ආකල්ප වර්ධනයක් මෙහි දී සිදු වේ.

**සමාජානුයෝජනය** නම් වූ අරමුණු ඇතැම් විට බටහිර සංවර්ධන සංකල්පයන්ට නැඹුරු සංවර්ධන සන්නිවේදන විශේෂඥයින්ගේ නොකැමැත්තට හා නොසැලකිල්ලට බඳුන් විය හැකි දෙයකි. ඒ මන්ද, නවීකරණය නම් වූ අදහස ක්‍රියාත්මක කිරීමේ දී මෙතුළින් බාධා ඇතිවේ යැයි සිතන අනියත බිය නිසාය. එහෙත් ඇතැම් සංවර්ධන විශේෂඥයින් සංවර්ධනයේ සමතුලිත බව අරභයා පාරම්පරිකව පැවතෙන සංස්කෘතික හා සමාජීය හරවත් දේ ඉවත නොද වැඩිදියුණු කරමින්ම නූතන සංවර්ධන සංකල්පයන්ට ගලපා ගත යුතු බව අවධාරණය කර සිටී.

සමාජය ආරක්ෂා කර ගැනීම නම් වූ අරමුණ තුළ දී සංවර්ධනයට එය අදාළ වන්නේ,

ඒ සඳහා සිදුවන බාධාකාරී සමාජ වාතාවරණයන්ගෙන් සමාජය ආරක්ෂා කර ගැනීමෙනි. සංවර්ධන ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාවන්ට නැංවීමේ දී බොහෝ අහිතකර හා අනර්ථකාරී බලවේගයන් හා බාධාවන් සිදුවන විට ඒ ගැන අවධානයෙන් සිට ජනතාව හා අදාළ අංශයන් දැනුවත් කිරීම හා ඊට සුදුසු පිළියම් පෙන්වා දීම හා සාකච්ඡා - සංවාද පුළුල් කිරීමත් ජනමාධ්‍යයන්ට කළ හැකි දේය.

ප්‍රේරණය නම් වූ අරමුණු තුලද, සැබැවින්ම, සංවර්ධන කාර්යය මුළුමනින්ම පෙළඹවීම ඉලක්ක කොට ගත්තකි. සංවර්ධන කටයුතු සඳහා දායක වන ජනමාධ්‍යයන් වෙතින් ද, කිනම් ආකාරයෙන් වුව ජනතාව වෙත යැවෙන සංවර්ධන පණිවිඩ පෙළඹවීම කේන්ද්‍ර කොටගන්නා ඒවා වීම විශේෂ දෙයකි.

මේ අයුරින් සංවර්ධනාත්මක සන්නිවේදනයේ දී ජනමාධ්‍ය භාවිත කිරීමේ එවන් වූ අරමුණු ඉතාමත් කාර්යක්ෂමව මෙන්ම ඵලදායි ලෙස ඉටුකර ගැනීමට නම්, අදාළ රට තුල සන්නිවේදන මාධ්‍ය පිළිබඳ විශේෂඥතාවයක් ලත් සන්නිවේදකයින් අවශ්‍ය වේ. සංවර්ධනය සඳහා සන්නිවේදන මාධ්‍ය භාවිතා කරන විට දී, එම සංවර්ධන පණිවිඩයන්ගේ ඒකාබද්ධතාවයත්, අඛණ්ඩතාවයත්, අනන්‍යතාවයත් රැකෙන පරිදි ඒවා විසරණය සඳහා සැලසුම්ගත විධිමත් සම්බන්ධීකරණයක් තිබීම අත්‍යාවශ්‍ය වේ. සංවර්ධනය හා ජනමාධ්‍ය පිළිබඳ නිශ්චිත ජාතික ප්‍රතිපත්ති මාලාවක් රටකට අවශ්‍ය ය. එවිට පවත්නා විවිධ බාධාකාරී තත්ත්වයන්ගෙන් ජනමාධ්‍ය මුදවා ගැනීම තුළ විශේෂයෙන් තුන්වන ලෝකයේ රටවල සංවර්ධන සන්නිවේදනයේ සාර්ථක ප්‍රතිඵල කරා මෙහෙයවීම පහසුවනු නොඅනුමානය.